රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 13/2021

මගේ අංකය : EST 5/4/24(XXXIII)
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2021.07.06

අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>සේවාමුක්ත භටයෙකු පත් කිරීමේ දී අදාළ කර ගත යුතු වැටුප තීරණය කිරීම</u>**

ආයතන සංග්‍රහයේ I වැනි කාණ්ඩයේ VII වැනි පරිච්ඡේදයේ 8 වගන්තිය කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

02. ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 17:1(ඈ) උප වගන්තිය යටතේ සේවාමුක්ත භටයෙකුට දෙනු ලබන අනුග්‍රහ යටතේ, රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සංස්ථාවක රැකියාවක් ලබාදීමේ දී එම නිලධරයාගේ වැටුප තීරණය කිරීමේ දී ආයතන සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයේ විධිවිධාන අදාළ කරගත යුතු බව සඳහන් කර ඇති නමුත් එම නිලධරයන්ගේ වැටුප සකස් කළ යුතු ආකාරය සම්බන්ධව නිශ්චිත විධිවිධානයන් එම පරිච්ඡේදයේ හෝ ආයතන සංග්‍රහයේ වෙනත් පරිච්ඡේදයක් තුළ හෝ අන්තර්ගත වී නොමැත. එබැවින් සේවාමුක්ත භටයෙකුට රාජ්‍ය සේවයේ පත්වීමක් ලබාදීමේ දී පිහිටුවිය යුතු වැටුප් පියවර හා සම්බන්ධ ආයතන සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයේ 8 වගන්තිය පහත පරිදි සංශෝධනය කිරීමටත්, අනතුරුව 8:9 ලෙස පහත සඳහන් පරිදි නව උපවගන්තියක් ඇතුළත් කිරීමටත්, 2020.10.12 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

**"8. නැවත සේවයට ගැනීමේ දී, විකල්ප සේවා නියුක්තියේ දී, මුදා හැරීමේ දී හා සේවාමුක්ත භටයෙකු ලෙස බඳවා ගැනීමේ දී ගෙවන වැටුප**

**8:9 සේවාමුක්ත භටයෙකුට ලබාදෙන අනුග්‍රහ යටතේ රජයේ සේවයට හෝ සංස්ථා සේවයට බඳවා ගත් නිලධරයකුගේ වැටුප එම නිලධරයා විසින් සන්නද්ධ සේවයේ යෙදී සිටි කාලය තුළ දී උපයාගෙන තිබූ වැටුප මත පදනම්ව මෙම පරිච්ඡේදයේ 9 වගන්තියේ විධිවිධාන අනුව සකස් කළ යුතු ය."**

ජේ.ජේ.රත්නසිරි
ලේකම්
රාජ්‍ය සේවා,පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය